ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 04 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම් ඉදිරිපත් කිරීමේ දුර්වලතා**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ආදායම් වියදම් ගිණුමේ (මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය) වටිනාකම් පසුගිය වර්ෂයේ අගයන් සමඟ සංසන්දනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජර්නල් සටහනක් මගින් රු.69,613 ක පුස්තකාල පොත් ඉවත් කිරීම ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි.

(ඇ) ජර්නල් සටහනක් මගින් සමුච්චිත අරමුදලට "හර" කර තිබුණු රු.312,863 න් එම ගිණුමට ගෙන තිබුනේ රු.289,063 ක් පමණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

**------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට වියදම් ණය හිමියෝ, ඉදිරිපත්කළ ගිණුම අනුව රු.7,978,264 ක් වුවද, ණය හිමි ලේඛනය අනුව රු.5,137,169 ක් වූයෙන් රු.2,841,095 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**--------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>ලැබියයුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 100,761,507ක් වු අතර එහි වර්ෂයක කාලයක් ඉක්මවා තිබෙන ශේෂ එකතුව රු.27,581,104 ක් විය.

(ආ) <u>ගෙවියයුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 53,414,140 ක් වූ අතර කිසියම් කාලයක් තබාගත යුතු තැන්පත් හැර ගෙවිය හැකි අනෙකුත් බැරකම් ගෙවා නිදහස්වීමට සභාව කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.21,169,434 ක් වූ ගිණුම් විෂයයන් 13 කට අදාළ උපලේඛන, කාල විශ්ලේෂණ හා විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

(ආ) විවිධ තැන්පත් ගිණුම " හර " කර තිබුණු රු. 23,800 කට අදාළ ජර්නල් සටහන් 17 හි අදාළ විස්තර සඳහන්ව නොතිබුණි.

**02 මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,131,517ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,220,563 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,910,954 ක වර්ධනයක් සිදු වී තිබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

--------------------------------

ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් රුපියල් මිලියන 9 කින් වැඩි වීම හා පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 22 ක් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

---------------------

**2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.114,003,287 ක් වූ අතර තත්‍ය ආදායම රු.129,735,065 ක් විය. නමුත් ආදායම් රැස් කිරීම දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.45,205,553 ක් වූ ලැබියයුතු ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.70,622,376 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 2.3.2 වරිපනම්

---------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා සීමාව තුල වූ නව සංවර්ධිත ප්‍රදේශ හදුනාගෙන නියමිත පරිදි ගැසට් කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබූ අතර , අවසන් වරට නව සංවර්ධිත ප්‍රදේශ හදුනාගෙන ගැසට් කර තිබුණේ වර්ෂ 30 කට ඉහතදීය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ගිණුම අනුව රු.5,672,677 ක හිඟයක් පවතින අතර , එම මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3.3 බදු කුලී

---------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) තිත්තවැල්ගාල අංක 2 මස් කඩය 2015 වර්ෂයේදී රු.231,510 ක මුදලකට බදුදී තිබුණු අතර ,2016 ඔක්තෝබර් මස වන විට එයින් රු.131,189 ක හිඟයක් පැවතුණි. 2016 වර්ෂයේ මෙම වත්කම රු.421,100 කට ටෙන්ඩර් කර මස් අලෙවි ස්ථානයක් ලෙස ගිවිසුම් අත්සන් කර තිබියදී අදාළ ටෙන්ඩර්කරු විසින් ඝෝගාතකාගාරයක් සඳහා බලපත්‍රයක්ද ඉල්ලුම්කර සභාවට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර සභාවට අය විය යුතු බදු කුලියද ගෙවීම පැහැර හැර තිබුණි.

(ආ) තිත්තවැල්ගාල අංක 01 හා අංක 02 වශයෙන් මස් කඩ 2 ක් එකම ප්‍රදේශයේ පවතින අතර 2016 වර්ෂයේ අංක 01 මස් කඩය රු.70,000 ක මුදලකටත්, අංක 02 මස් කඩය රු.421,100 ක මුදලකටත් ටෙන්ඩර් වී තිබුණි. තිත්තවැල්ගාල අංක 01 මස් කඩ කඩය අංක 02 මස් කඩයට සාපේක්ෂව අඩු මුදලකට ටෙන්ඩර් වී තිබුණු අතර පසුගිය ආසන්න වර්ෂ 05 ක් තුල අවම ලංසු මුදල රු.14,000 කින් පමණක් වැඩි කර තිබුණි.

(ඇ) 2016 වර්ෂය සඳහා වත්කම් බදුදීමේදී තීරණය කර ඇති අවම ලංසුව, 2012 වර්ෂයේ අවම ලංසුව හා සැසදීමේදී වත්කම් 05 ක අවම ලංසුව වර්ෂ 4 ක් තුල අඩුකිරීම හෝ ඉතා කුඩා වටිනාකමකින් පමණක් වැඩි කර තිබීම තුල සභාවේ ආදායම් මාර්ග වර්ධනයට අහිතකර ලෙස බලපා තිබුණි.

(ඈ) වාර්ෂික ටෙන්ඩර් මත බදු දී තිබුණු දේපල 5 කට අදාළව අයවිය යුතු රු.357,909 ක මුදල සහ ඒ මත අයකළ යුතු දඩ මුදල්ද ගණනය කර අදාළ මුළු මුදල අයකර ගැනීම සඳහා 2016 වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඉ) 2013 අප්‍රේල් 08 දින ප්‍රසම්පාදන කැඳවීම් අනුව තක්සේරු වටිනාකම රු.8,565,263 ක් වූ මැල්සිරිපුර බස් නැවතුම්පල කඩ කාමර 07 පෙර ගෙවුම් ක්‍රමයට ලබාදීමට කටයුතු කර තිබුණු අතර කොන්දේසි අනුව ටෙන්ඩර් මුදලින් සියයට 50 ක් දින 14 ක් ඇතුළත හා ඉතිරි සියයට 50 මාස 06 ක් ඇතුළත වාරික වශයෙන් ගෙවිය යුතු වුවත් පෙර ගෙවුම් මුදල ලෙස සභාවට අයවිය යුතු රු.4,280,191 ක මුදලක් 2016 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද කඩ කාමරවලට අදාළ කුලී අයකර ගැනීමටද සභාව කටයුතු කර නොතිබුණි.

### 2.3.4 බලපත්‍ර ගාස්තු

----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රාදේශය තුල වූ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්වල වාර්ෂික ආදායමින් ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව වාර්ෂික බදු මුදල් අයකළ හැකි වුවද, වසර 6 සිට වසර 18 අතර, කාලයක් තුළ අදාළ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල බලප්‍රදේශයේ 2016 වර්ෂයේදී සිදු කරන ලද සමීක්ෂණය අනුව වෙළඳ ව්‍යාපාර 736 ක ප්‍රමාණයක් පවතින බව හඳුනාගෙන තිබු නමුත් 2016 ඔක්තෝබර් 30 දිනට එයින් ව්‍යාපාර ආයතන 432 ක් පමණක් වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවා තිබුණි.

### 2.3.5 වෙනත් ආදායම්

------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මැල්සිරිපුර නගරයේ පිහිටි සමනල සිනමා ශාලාවෙන් වර්ෂ 10 ට වැඩි කාලයක සිට අයකළ යුතුව තිබෙන රු.39,215 ක විනෝද බදු මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) ඉබ්බාගමුවේ පදික කඩ 13 ක් සම්බන්ධයෙන් වූ කඩ කුලිය අවසන් වරට සංශෝධනය කර තිබුණේ 1998 වර්ෂයේ වන අතර ඉන් පහළ වර්ෂවලදී සභා තීරණය මත මාසික කුලිය අය කිරීම නිසා සභාවට ලැබිය යුතු සත්‍ය ආදායම ලැබී නොතිබුණි.

(ඇ) කුඹුක්ගැටේ ප්‍රදේශයේ පදික කඩ 07 ක් හා කාර්යාල භූමි කඩ කාමර 03 ක් දීර්ඝ කාලීනව බදු දී තිබු අතර මෙම කඩ සඳහා වූ කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරවාගෙන නොතිබුණි. 2015 වර්ෂය ආරම්භයේදී රු.18,000 ලෙස සංශෝධනය කරන ලද වාර්ෂික කුලිය 2015 වර්ෂයේ ජුනි මාසයේ සිට සභා තීරණයක් අනුව රු.12,000 ක් ලෙස අඩුකර තිබීම නිසා සභාවට පාඩුවක් සිදුවී තිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.802,877ක් හා මුද්දර ගාස්තු රු.25,286,306 ක් විය.

**03. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වරාවල/සීරාදුන්න, කුඹුක්ගැටේ සහ හිරිපිටිය මහජන පුස්තකාලයන්හි ඉඩ පහසුකම් සහිත ගොඩනැගිල්ලක් නොතිබීම, විදුලිය නොමැති වීම, පොත් පිළිවෙලකට තැබීම සඳහා ප්‍රමාණවත් රාක්ක නොතිබීම සහ අපහරණය කළ යුතු පුවත්පත් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබීම මත තැනින් තැන ගොඩගසා පැවතුණු අතර ගොකරැල්ල මහජන පුස්තකාලයේ වහලය අළුත්වැඩියා කිරීමේ කටයුතු 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, 2016 නොවැම්බර් මාසය වන විටද, නිමකර නොතිබුණි. මෙම අළුත්වැඩියාවට අදාළ ඇස්තමේන්තුව, ප්‍රමාණ පත්‍ර, මිනුම්පත්, බිල්පත් යනාදී විස්තර විෂයය ලිපිකරු විසින් විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

(ආ) i වෙන්දේසි මගින් විකිණීමට කට්ටි කරන ලද මැල්සිරිපුර සිරිපුර වත්ත ඉඩම සහ නැකැත්ත හැළඹගහමුලහේන ඉඩම බිම් කොටස් සඳහා විදුලි බලය ලබාදීමට කටයුතු කර නොතිබුණි.

ii. 2014 ඔක්තෝබර් 01 දිනැති අංක 1882/22 දරන ගැසට් පත්‍රයේ 07 ජේදය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉඩමක් කට්ටි කර විකුණනු ලබන සෑම අවස්ථාවකදීම නේවාසික කාර්යයන් සඳහා වන ඉඩම් කට්ටියක අවම පළල මීටර් 12 ක් හා වපසරිය පර්චස් 15 ක් විය යුතු වුවත්, මැල්සිරිපුර සිරිපුර වත්ත ඉඩමේ කට්ටි අංක 3 සහ 4 හි පිළිවෙලින් පර්චස් 13 ක් සහ 12 ක් වූ අතර අභ්‍යන්තර මාර්ගයක් වෙනත් මාර්ගයකට සම්බන්ධ නොවන්නේ නම් එසේ සම්බන්ධ නොවන කෙළවර විශ්කම්භය මීටර් 09 කට නොඅඩු හැරවුම් වෘත්තයක් පරිදි සකස් කළ යුතු වුවද, මැල්සිරිපුරවත්ත සහ නැකැත්ත හැළඹගහමුලහේන ඉඩම් කට්ටි කිරීමේදී එවැනි වෘත්තයක් අයුරින් ඉදිකර නොතිබුණි.

**3.2 හඳුනාගත් අලාභ**

**-------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වසර 02 ක සිට වසර 22 දක්වා කාල පරාසයක් තුළ පුස්තකාල 05 ක බාහිර පාඨකයින් විසින් බැහැර ගෙන ගොස් තිබුණු රු.77,077 ක් පුස්තකාල පොත් 1029 ක අලාභය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) මැල්සිරිපුර ආදාහනාගාරයේ තොග පොත් අනුව 2016 නොවැම්බර් 02 දිනට කි.ග්‍රෑම් 790 ක ගෑස් ශේෂයක් පැවති අතර භෞතික පරීක්ෂාවට අනුව ප්‍රමාණය කි.ග්‍රෑම් 270 ක් පමණක් වූයෙන් ගෑස් කි.ග්‍රෑම් 520 ක ඌණතාවයක් පැවතුණි.

**3.3 නිෂ්ක්‍රීය වත්කම්**

**--------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වසර 05 ක පමණ කාලයක සිට ක්‍රියාවිරහිතව පවතින රු.238,800 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍රයක් හා රු.31,500 ක් වටිනා ලේසර් ප්‍රින්ටර් යන්ත්‍රයක් පැවතුණි.

(ආ) 2014 වර්ෂයේදී වරාවල/ සීරාදුන්න මහජන පුස්තකාලය සඳහා ඉදිකර තිබෙන වැසිකිලිය ජල පහසුකම් නොමැති වීම හේතුවෙන් ඉදිකළ දින සිටම වසාදමා තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නා බැට ජල ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේදී රු.1,336,545 ක් වැයකර ඉදිකර තිබුණු ජල ටැංකියේ පතුලින් ජලය කාන්දුවන බව 2015 ඔක්තෝබර් 23 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදි තහවුරු වී තිබු අතර 2016 දෙසැම්බර් 02 දින වන විටද, එම ජල කාන්දුව යථා තත්ත්වයට පත්කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේදී ඉදිකර තිබුණු හිරිපිටිය උප කාර්යාලයේ වාහන නවතා තැබීමේ ගරාජයේ ඉදි කිරීම්වල පවතින අඩුපාඩු 2016 නොවැම්බර් 02 දින වන විටද සකස් කර නොතිබුණු අතර එම ගරාජය තුළ වාහන ගාල් කිරීමද සිදු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී රු.876,704 ක් වැයකර වාඩුවාව මාර්ගය කෝන්ක්‍රීට් කිරීම සිදුකර තිබුණු අතර 2016 නොවැම්බර් 02 දින එම මාර්ගය භෞතිකව පරීක්ෂා කිරීමේදී 191´x10´x6" ප්‍රමාණයක් පාර මැදින් පුපුරා කොන්ක්‍රීට් ගැලවෙමින් පැවතුණි. 2013 සහ 2014 වර්ෂවලදී මෙම මාර්ගයේ ඉතිරි කොටස් කෝන්ක්‍රීට් කර තිබුණු අතර, එම කොටස්ද මැදින් පුපුරා ගැලවෙමින් පැවතුණි.

(ඇ) රු.1,148,226 ක ඇස්තමේන්තුවක් යටතේ කොන්ක්‍රීට් කරමින් තිබූ මාලගමුව උඩුගොඩගම මාර්ගය 2016 නොවැම්බර් 02 දින පරීක්ෂාවේදී එක් සිමෙන්ති මිටියකට වැලි සවල් 20 ක් හා අඟල් 1 ½ සක්ක ගල් සවල් 30 ක් වශයෙන් යොදමින් තිබූ අතර අඟල් 6 ක කොන්ක්‍රීට් තට්ටුව වෙනුවට මාර්ගය මැද කොටස උස්ව පවතින අයුරින් අඟල් 4 ක් පමණ ඝණකමට සිටින සේ කොන්ක්‍රීට් අතුරමින් තිබුණි. තවද කොන්ක්‍රීට් සඳහා පස් සෝදා සකස් කරන ලද මඩ සහිත සියුම් වැල්ලක් භාවිතා කරමින් තිබූ අතර ඇස්තමේන්තුවේ සඳහන් රු.55,761 ක් වූ වැඩ විෂයයන් 04 ක් ඉටුකර නොතිබුණි. එසේම කොන්ක්‍රීට් කිරීම අධීක්ෂණය සඳහා කාර්මික නිලධාරියෙක් සම්බන්ධ වී නොතිබුණි.

**3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

------------------------------

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නිශ්චිත වැඩ පිළිවෙලක් සමාලෝචිත වර්ෂය තුළදී ද ක්‍රියාත්මක කර නොතිබුණු අතර දෛනිකව එකතුවන කසල වර්ෂ ගණනාවක සිට පෞද්ගලික ඉඩම්වලට බැහැර කර වල දැමීම හා ගිණි තැබීම සිදු කරමින් පැවතුණි.

**04 පද්ධති හා පාලනය**

--------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ අඩුපාඩු වරින් වර ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ස්ථාවර වත්කම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම.<br>ජර්නල් සටහන් හා එයට අදාළ සංලක්ෂයන් නිසි පරිදි නොයෙදීම.<br>ජංගම වත්කම්, ජංගම වගකීම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම.<br>හෙළිදරව් කිරීමේ දෝෂ, ආදායම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම. |

| | | |
|---|---|---|
| | | ලේඛන හා උපලේඛන, ගිණුම් හා උපලේඛන අතර වෙනස්කම් පැවතීම.<br>මුදල් පොත් හා ගිණුම් පොත් ශේෂ නොකිරීම.<br>පැන්සලෙන් සටහන් කර තිබීම.<br>සටහන් ටිපෙක්ස් කර මකා දැමීම. |
| (ආ) | ආදායම් පාලනය | දේපල තක්සේරු නොකිරීම.<br>ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට රීති ප්‍රකාරව කටයුතු නොකිරීම.<br>දීර්ඝ කාලීනව පවතින හිඟ ශේෂ හඳුනා නොගැනීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | වත්කම් භාවිතයේදී ඇති වූ අකාර්යක්ෂමතා.<br>නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් පැවතීම.<br>ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම.<br>ඉඩම් වත්කම් අගය තක්සේරු කර නොතිබීම. |
| (ඈ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ඇස්තමේන්තු සකස් කිරීමේ දෝෂ පැවතීම<br>මහජනතාවගේ අවශ්‍යතා හඳුනා නොගැනීම.<br>ව්‍යාපෘති ක්‍රියාත්මක අවස්ථාවේදී අධීක්ෂණයක් නොතිබීම හා පසු විපරම් නොකිරීම. |
| (ඉ) | කසල කළමනාකරණය | සභා බල ප්‍රදේශය තුල දෛනිකව එකතුවන කසල පරිසර හිතකාමී අයුරින් අපහරණය කිරීමට කටයුතු නොකිරීම. |